ලිංගික අතවරයන් සම්බන්ධයෙන් වගකීම් සහගතව වාතර්ා කරමු!
කොළඹ තරු පහේ හෝටලයක දී, කෝටිපති ව්‍යාපාරිකයකු විසින් තරුණියකට ලිංගික අපරාධයක් සිදු කළ බවට පැවසෙන පුවතක්, ලංකාදීප පුවත්පත (ජූලි 19, 2023) වාතර්ා කර තිබුණේ මෙසේය.
"කොළඹ තරු හෝටලයක දී තරුණියකට තරු පෙන්වූ කෝටිපතියෙක් අත්අඩංගුවට" (මෙය "දූෂණයක්" ලෙසට පුවත් අන්තගර්තයේ සඳහන් වේ.)
ඔබේ අදහසට අනුව,
1) ලිංගික අපරාධයක් මෙම තරුණියට සිදුවී ඇති බව, සිරස්තලයේ "තරුණියකට තරු පෙන්වීමක්" ලෙසින් වාතර්ා කිරීම ඔස්සේ, ගම්‍ය වන්නේ ද? එය සිදුවූ බවට පැවසෙන ලිංගික අපරාධයක් සැහැල්ලු කර දැක්වීමක් නොවේද?
2) පුවත් අන්තගර්තයේ මෙය "දූෂණයක්" ලෙසින් දක්වනවාට වඩා ලිංගික අපරාධයක් ලෙසින් දැක්වීම යෝග්‍ය නොවන්නේ ද? ඒ ඔස්සේ, මෙම සිදුවීමට මුහුණ දුන් අය අපවිත්‍ර වූ බවට වන අදහස නැතිවන්නේ නොවේද?
3) මෙවැනි සිදුවීමට මුහුණ දුන්නේ ඔබනම්, ඔබ මෙම සිරස්තලය හා එකඟ වන්නේද?
**Ethics Eye නිරීක්ෂකයෙකු වීමට ඔබත් කැමතිද? එසේ නම්, ඔබ හඳුනාගන්නා මාධ්‍ය ආචාර ධමර් කඩ කිරීම් අප වෙත එවන්න.
*අපගේ නිරීක්ෂණයන් WhatsApp ඔස්සේ නොමිලේ ලබා ගන්න! ඔබගේ නම සහ WhatsApp අංකය සෘජු පණිවිඩයක් (DM/inbox) හරහා අප වෙත එවා, දැන්ම Ethics Eye subscriber කෙනෙකු වන්න!